නාට්‍යයේ දෙවන අංකයට පිවිසෙන විට අප ඉදිරියේ නොවතින ගැටුමක ප්‍රවේශයක් ගොඩනැගෙයි. සිංහබාහු තුළ ඇතිවන විචිකිච්ඡාව ඊට හේතුවෙයි. එහෙයින් පියා මග හරවා නැවතත් මවගෙන් ප්‍රශ්නකිරීමේදී දරුවන්ගෙන් මගහැරීමට අසීරුවෙයි. මෙතෙක් තමන් වසන්කර තිබූ රහසක් හෙළිකිරීමට සිදුවන නිසා නාට්‍යය උච්ඡාවස්ථාවක් දක්වා විකාශනය වී යයි.

ප්‍රේමවන්ත දරුවනි මා
හිඳිනු කන් යොමා
කියමි පුවත සැක දුරුරා
අසන නිතියෙනා
මෑණිය නුඹ දෙදෙනගෙ මේ
කුමරියක් මහා
පසිඳු මහගු වංග දේසේ
නරවරහට දා

සුප්පා දේවිය තම දරුවන් දෙදෙනාට මෙසේ දිගින් දිගට තම රාජවංශය ගැනත් සිංහයාට පිදූ ආදරය ගැනත් අනෙක් සියලූ සැප සම්පත් ඒ ආදරය වෙනුවෙන් කැප කළ ආකාරයත් නාට්‍යාලංකාරයෙන් පෙන්වාදෙයි.

අසිරිමත් වූ දේකි මෙලොව ප්‍රේමය නමිනා
වැනූ හෙරණ කිවිඳුන් සොඳ රසමුසු බසිනා
සියළු භෝග වස්තු ඉසුරු හරින්නෙක් දනෝ
සව් සැප දෙන සිතුමිණ වන් ප්‍රේමය සන්දා

තම මෑණියන් රාජකුමරියක බව දැනගත් සිංහබාහු මෙන්ම සිංහසීවලීද තමාට අහිමි වූ රජ සම්පත් පිළිබඳ මැසිවිලි නගති. සිංහබාහුගේ ආවේගය මව ඉදිරිපිට හෙණ ගෙඩියක් සේ පතිත වෙයි.

යන්ට දැන්නම් කාලෙ වේ
මෑණියන් හා නැගණියන් සමගින්
උරුමෙ අපගේ සොයමිනා
වංග දේසේ වෙසෙන ජනතා
කෙරෙහි වේ මා යුතුකමා
කුමක් දෝ මේ සාපේ
ලෙනේ මේ විසීමේ - සෙතක් දෝ

මාරුතයකට හසුවන සුප්පාදේවිය මවකට මුහුණ පෑමට සිදුනොවන තරමේ උභතෝකෝටිකයකට මුහුණ දීමට සිදුවෙයි. සිංහබාහු ගල්ලෙන බිඳ දමා තමා සමග පිටව යාමට බලකරයි. නැතහොත් තනිව හෝ උරුමය සොයා යන බව පවසයි. තම සෙනෙහස හෝ ආයාචනයට පිටුපාන්නා වූ දරුවන් සන්දා * තමා පෙම් බැඳි සැමියා හැර දමා යාමට ඇය එකගවන්නේ කෙතරම් ආයාසයකින්ද? සුප්පාදේවි මෙසේ සුසුම් හෙළයි.

නුඹගේද - නුඹ නැගණියන්ගේද යහපත පිණිස මම නුඹ පියාණන් හැරදමා යන්නට සනිටුහන් කරගතිමි. මා මෙසේ කරන්නේ හද තුළ ඇති මහත් වේදනාවෙනි. දිවි හිමියෙන් මා ඒ වේදනාවෙන් පෙළෙන බව මම දනිමි

ඇය ලෙනට සමුදෙන්නේ ස්වාමියා දෙවියන්ට භාරකරමිනි. සමසේ ගල්ලෙන හැරදමා පිරිසේ නික්මීම වාට්‍යයේ කතාපුවත තවත් හැරවුම් ලක්ෂයකට යොමු කරයි.

සුපුරුදු පරිදි ආහාර සොයා වනයෙන් ආපසු එන සිංහයා පාලූ ගත්ලෙන දැක හැසිරෙන විලාසය දරාගත නොහැකි අන්දමේ දසුනකි.

ගල්ලෙන බිඳලා - ලෙන්දොර හැරදා - සිංහබා ගීතය සිංහබාහු නාට්‍යයේ සමස්ථ රිද්මය ම විලාපයකට කැටිකොට ගැනීමකි. එය එක පැත්තකින් පුත්‍ර සිංහබාහු සිංහ පියාට එල්ල කරන ලද අභියෝගයකි. අනික් පසින් සිංහයා තම ප්‍රියම්භිකාව සහ දරුවන් දෙදෙනා මං හසරක් නොදැන අනතුරකට භාජනය වේ යයි සෙනෙහසින් හා බියෙන්ද ඇළලී ගොස් වියරුවට පත්වෙයි. සිංහයා ගමරට වනසමින් හැසිරෙන්නේ එම උමතුවෙනි. ඒ අතර නාට්‍යයේ තෙවන අංකයේදී ප්‍රත්‍යන්ත ජනපදයකට පිවිසෙන සිංහබාහු තම මව හා නැගණිය සමග එම ප්‍රදේශයේ යුව රජු හඳුනාගෙන ආරක්සාව සළසා ගනියි. ඔවුන් සොයමින් මග වනසමින් මිනිසුන් මරමින් එන සිංහයාගෙන් රටවැසියා මුදවා ගැනීම යුව රජුට අභියෝගයක් වෙයි. මෙවැනි මොහොතක සිංහබාහු වැනි වීරෝ- ඨාර චරිතයක් තමාට සෙවණ දුන් යුවරජුට පිළිසරණක් ලබාදීමට ඉදිරිපත්වීම යුක්ති යුක්තය. ඔහු සිංහයා මැඩලීමට ඉදිරිපත්වන්නේ ඒ තම පියා බව දැනගෙන නොවේ. සුප්පා දේවියට එය ඉවෙන් මෙන් පසක් වෙයි. පුතු සටනට යාම වළක්වාලීමට ඇය සවහෙස වන්නේ සිංහයාගෙන් පුතුට අනතුරක් වේ යයි බියෙනි. නාටයයේ හතරවන අංකයේදී පිය පුතු සටන කථා වින්‍යාසයේ ඵලප්‍රාප්තිය ලෙස ගොඩනැංවීමට සරච්චන්ද්‍රයන් සූක්ෂම රචනාමය උපාය මාර්ගයක් යොදා ඇති බව පෙනී යයි.

සිංබාහු නාටකය පුරාවටම දෝලනය වන මානුෂික හැඟීම් ක්‍රියාවලිය නම් ප්‍රේමයේ සංචලනයයි. සුප්පා දේවිය තම රජසැප තුමුල් මාළිග සියල්ල හැරදා ගල්ලෙනට එන්නේ අසිරිමත් ප්‍රේමයක් පූජා කිරීමෙනි. සිංහයා සහ ඇය වනාන්තර රජ දහන තුළ පුරා සොළොස්වසක් දරුවන් හදා වඩා ගන්නේ අපමණ දරු සෙනෙහසකිනි. සිංහයා ප්‍රේක්ෂක අනුකම්පාවට භාජනය වන්නේද ඔහුගේ මේ අසමසම අඹුදරු ප්‍රේමය නිසාම ය. එහෙත් දරුවන් වයසින් ඇති දැඩි වත්ම මව්පිය සෙනෙහස ක්‍රමයෙන් ඈත් වී වෙනත් ඉසව් කරා සිත පියඹා යාම වැළැක්විය නොහැකිය.සිංහබාහු වුවද කළේ පියාට ද්‍රෝහි වීමක් නොවේ. තම රාජ්‍ය උරුමය දැනගත් ඔහුට ගල්ලෙන සිරගෙයක් වීමද පුදුමයක් නොවේ. ඔහු මව හා නැගණිය නොආවත් තම ඉරණම් ගමන යාමට පෙළැඹී තිබුණි. පුතාගේ එම තීරණයට සුප්පා දේවිය අසරණවීම විනා විරුද්ධ වීම නොහැකි වූවා ය. ඇය ද පුතු සමග ගල්ලෙනෙන් බැහැර වීමට තීරණය කරන්නේ සැමියා කෙරෙහි ගොඩ නැගුණ ආලය දාරක ප්‍රේමය වෙනුවෙන් කැපකිරීමෙන් ය.

නාට්‍යයේ අවසාන සටනේදී අපට දැනෙන්නේ පිය පුතු අතර වෛරයකින් කෙරෙන පළිගැනීමක් නොවේ. සිංහයා කුරිරු වූයේ බිරිඳ හා දරුවන් නිසා නොව ඔවුන්ට එෙස් යාමට නරයක් උදව් කළ බව සිත_ හෙයිනි. සිංබාහු තමා හා සටනට පැමිණිවිට සිංහයා තමා මැරීමට ආ තවත් නර තරුණයකු යයි ඔහුව සැක කරයි. එහෙත් ඒ සිංබාහු බව දැනගත් විට ඔහු දාරක ප්‍රේමයෙන් මුසපත් වේ. සිංබාහුට ද පීතෘ සෙනෙහස උපදී. එහෙත් ඒ බව සගවා ආත්ම වංචනයෙන් තම ඉරණම සොයා සිත සනසා ගැනීමට පෙළඹෙයි. සිංහබාහු සමග සිංමයා අවසානයේ සටන් වදින්නේ පුතුට ද් ඬුවම් දීමට නොව ඔහුගේ මානය බිඳ හදා ගැනීමට ය. එහෙත් තෙවන හීසර සමග සිංහයා  තුළ තිබූ දාරක පෙම සමග මෛත්‍රී කරුණාවද පහව යයි. සිංහයා මරු වැළඳගනී. මෙසේ දාරක ප්‍රේමයේ සියුම් සංවේදනාව දාර්ශනික තේමාවකට යොමුවන ආකාරයට නාට්‍යයේ දෘෂ්ටිය විනිවිදව ගමන් කරමින් නාට්‍යය නිමාවට පත්වෙයි.

බෞද්ධ දර්ශනයට අනුව පුතකු විසින් තමාට මෙතරම් සෙනෙහස දැක්වූ පියකුට සිතතාමතාම මෙවැන්නක් සිදු කළ හැකිද යන්න මෙහිදී පැන නගී. එහෙත් දාරක ප්‍රේමය පියකුට තරම් දරුවන් තුළ කවදා එසේ දැනේව්දැයි අපට සිතාගත නොහැකිය. කෙසේ වෙතත් සිංහබාහු නාටකය යනු විශ්ව සාධාරණ අති මානුශීය ස්වභාවයන් කීපයක් සෞන්දර්යාත්මකව විමර්ශනයට ලක්කෙරෙන සමාභාව්‍ය දෘෂ්‍යකාව්‍යයක් ලෙස හැඳින්විය හැකිය.

පුතු සෙනේ පිතු හද තුළම මිස
නැත පුතුන් හද තුළ රැඳන්නේ
ඇට තුළට වැද ඇට මිදුලූ මත
සදාකල් නැත දුක් දෙවන්නේ


# IMMIGRATION LAW @
## Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

**Professional Immigration Legal Services**
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships  Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals




General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



**Susantha Katugampala**
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



*We Deliver Results...*